කොවිඩ්-19 වැළඳීම හේතුවෙන් සිය මව රෝහල්ගත කිරීමෙන් පසු පුතු විසින් දිවි අහිමි කරගනු ලැබූ පුවත බොහෝ මාධ්‍යයන්හි අවධානයට ලක්ව තිබූ අතර, සමාජ මාධ්‍ය තුළද කථාබහට ලක්ව තිබිණි.

අරුණ පුවත්පතේ මේ පිළිබඳව පළව ඇති (11/03) ලිපිය තුළ එම පුතු දිවි අහිමි කරගත් ආකාරය දක්වා ඇත. එසේම එහි උපකාරක අංකයන්ද පළ කොට නොමැත.

මෙවැනි පුවතක් වාර්තා කිරීමේදී දිවි අහිමි කරගත් ආකාරය පළ නොකරන ලෙසට මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශනයන් තුළ පැවසෙන්නේ ඒ ඔස්සේ එම ක්‍රමය භාවිතා කරමින් තවත් අයෙකු දිවි අහිමි කරගැනීමකට පෙළඹීමේ ඉඩක් පවතින බැවිනි. එසේම දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට ඉඩක් ලැබෙන ලෙසින් මෙවන් පුවතක් සමගින් උපකාරක අංක පළ කරන ලෙසද මාධ්‍යවේදීන්ව දිරිමත් කරනු ලබයි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
මූලාශ්‍ර:
https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting?fbclid=IwAR3fde9cEIsXqNz6QktfN9uUXW2CHRwMfxH_3vqMYN4nKyWVNhFh2DAJw74

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1&fbclid=IwAR37odzU0qEGt3N3_u-rtf363TWKWKstreSzgmblDtYu1jsrJRuy3vBDGrc

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna